# POLS 3107.03 - Political Parties, Pressure Groups and Public Opinion

## දේශපාලන පක්ෂවල ප්‍රභවය

නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ අපූර්වතම සොයා ගැනීම වශයෙන් දේශපාලන පක්ෂ හඳුන්වනු ලැබේ. එනම් නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තරඟකාරී විවෘත ක්‍රමයක් වන අතර එම දේශපාලන තරඟකාරීත්වය ඇති වන්නේ දේශපාලන පක්ෂ මුල් කරගෙන ය. එනම් දේශපාලන පක්ෂ නොමැතිව නූතන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළ නොහැක. ඒ අනුව නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා මූලික විචල්‍ය වශයෙන් දේශපාලන පක්ෂ වැදගත් වේ. මෙම දේශපාලන පක්ෂ මෑතක බිහි වූවක් නොවන අතර එය දීර්ඝ කාලීන විකාශනයක ප්‍රතිඵලයකි.

දේශපාලන පක්ෂ බිහිවීමේ ඉතිහාසය නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ බිහිවීම හා ඍජු ලෙස සම්බන්ධ වී තිබේ. යුරෝපයේ නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රභවය වූයේ 17 වැනි ශතවර්ෂය අගභාගයේ පටන්ය. විශේෂයෙන්ම බටහිර යුරෝපයේ ඒකාධිපති රාජාණ්ඩුවාදයට එරෙහිව මිනිස් නිදහස හා අයිතිවාසිකම් තහවුරු කර ගැනීම සඳහා ජනතාව විසින් ගෙනයනු ලැබූ අඛණ්ඩ අරගලයේ ප්‍රතිඵලය වශයෙන් නූතන ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රභවය විය.

විශේෂයෙන්ම 1688 දී එංගලන්තයේ ඇති වූ උත්කෘෂ්ඨ විප්ලවය නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනය කෙරෙහි බලපෑ ආරම්භක ප්‍රවේශය විය. එම විප්ලවයේ දී පාර්ලිමේන්තුවේ නියෝජිතයින් විසින් 2 වැනි ජේම්ස් රජු බලයෙන් පහකොට පාර්ලිමේන්තුවට අවනත රාජාණ්ඩුවක් ස්ථාපිත කිරීම තුළින් එංගලන්තයේ නියෝජිත ආණ්ඩුක්‍රමයේ මූලික අඩිතාලම ගොඩනැගුණි. එමෙන්ම 1776 ඇමෙරිකන් විප්ලවය ද ඒකාධිපතිවාදයට එරෙහිව ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයකි. බ්‍රිතාන්‍ය යටත්විජිත ආධිපත්‍යට එරෙහිව ඇමරිකානු ජන්දවාසීන් (ඉංග්‍රීසි) විසින් ගෙනයනු ලැබූ විමුක්ති අරගලය තුළින් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීමට එම ජනතාව සමත් වූ අතර එමගින් ඇමරිකා එක්සත් ජනපදයේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය බිහි විය.

දේශපාලන පක්ෂවල ආරම්භය බ්‍රිතාන්‍ය හා ඇමරිකා එක්සත් ජනපදය ඇසුරින් සිදු වී තිබේ. බ්‍රිතාන්‍යයේ මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ ද දේශපාලන පක්ෂ බිහි වූයේ දිගුකාලීන ප්‍රවනතාවන් හේතුකොටගෙනය.

ඉංග්‍රීසි විප්ලවයට පෙර එනම් 1688 දී බ්‍රිතාන්‍යයේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ දේශපාලන කණ්ඩායම් දෙකක් දක්නට ලැබුණි. එනම් සාම්ප්‍රදායික ඉඩම් හිමි රදළයින්ගෙන් සමන්විත ටෝරි කණ්ඩායම් හා වාණිජ මැද පංතියෙන් සමන්විත විග් කණ්ඩායමයි. 1648 සිට 1658 දක්වා එරටෙහි සිවිල් යුද්ධය හට ගත්තේ මෙකී දෙපාර්ශවය අතරය. එහෙත් සිවිල් යුද්ධයෙන් අනතුරුව ඒකාධිපති රාජාණ්ඩුවාදයට එරෙහිව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ටෝරි සහ විග් දෙපාර්ශයේ නියෝජිතයින් එක්සත්ව ගෙනගිය අරගලය තුළින් 1688 ඉංග්‍රීසි විප්ලවය හටගැනුණි. බ්‍රිතාන්‍යයේ දේශපාලන පක්ෂ ආරම්භ වූයේ මෙකී ටෝරි හා විග් යන දේශපාලන කණ්ඩායම් ඇසුරිනි. ඇත්ත වශයෙන්ම මුල් අවධියේ ටෝරි සහ විග් දෙපාර්ශවයම සුළු

කණ්ඩායම් විය. එනම් ප්‍රභූ කණ්ඩායම් විය. බ්‍රිතාන්‍යයේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙහි ප්‍රභවය සිදු වූයේ මෙකී දේශපාලන සමාජ බලවේගයන් දෙක මුල්කරගෙනය.

ඉංග්‍රීසි විප්ලවයෙන් අනතුරුව ක්‍රමානුකූලව බ්‍රිතාන්‍ය දේශපාලන සමාජයෙහි ප්‍රජාතන්ත්‍රවාදී මූලයන් සංස්ථාපනය වීමට පටන් ගැනුණි. 18 වැනි ශතවර්ශය අගභාගයේ දී බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය හට ගැනීමත් සමග වර්ධනය වූ කාර්මික ධනවාදය හේතු කොට ගෙන කර්මාන්ත හිමි ධනපති පංතියක්ද කම්කරු පංතියක් ද බිහි විය. මීට අමතරව සමාජයෙහි මැද පංතියක් ද ව්‍යාප්ත විය. මෙසේ බිහි වූ නව සමාජ පංති බලවේගයන් ගේ දේශපාලන වුවමනාවන් ඉටු කර ගැනීම සඳහා පැන නැගුනු අරගල තුළින් නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලයන් ස්ථාපිත වූ බව පෙනේ. විශේෂයෙන් ම නියෝජනය හා ඡන්ද බලය වර්ධනය වීම මෙමගින් සිදු විය.

නියෝජනය ඡන්ද බලය වැනි සංකල්ප දේශපාලන සමාජයන් තුළ සංස්ථාපනය වීම සිදු වූයේ නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික හරය වන මහජන පාලනය පිළිබඳ සංකල්පය මුල් කරගෙනය. 1689 අයිතිවාසිකම් පනත මගින් රජුගේ බලය පාර්ලිමේන්තුවට යටත් වුවද පාර්ලිමේන්තුවේ මහජන මණ්ඩලයේ නියෝජිතයින්ගෙන් 2/3 ක් පත්කරනු ලැබුවේ රජු විසිනි. එම නියෝජිතයින් ගෙන් 1/3 ක් පත්කරනු ලැබුවේ සාමි මන්ත්‍රී මණ්ඩලය විසිනි. මේ අනුව පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රීවරුන් සැබෑ මහජන නියෝජිතයන් නොවූහ. එහෙයින් අළුතින් වර්ධනය වූ සමාජ පංතීන් ඒ වන විට පාර්ලිමේන්තුවට නියෝජිතයින් පත්වීමේ ක්‍රමය කෙරෙහි සෑහීමකට පත් නොවූ අතර විශේෂයෙන්ම කර්මාන්ත හිමි ධනපති පංතිය මෙන්ම මැද පංතිය ද ස්වකීය නියෝජිතයන් පාර්ලිමේන්තුවට තෝරා පත් කිරීම සඳහා ඡන්ද බලය දිනා ගැනීම කෙරෙහි නැඹුරු වීම තුළින් බ්‍රිතාන්‍යයේ 19 වැනි ශතවර්ෂය මුල්භාගය වන විට නියෝජනය හා ඡන්ද බලය පිළිබඳ සංකල්පයන් ප්‍රචලිත වීම සිදු විය. මෙහි ප්‍රතිඵලය වූයේ 1832 පාර්ලිමේන්තු පණතක් මගින් බ්‍රිතාන්‍යයේ සීමිත ඡන්ද බලය ක්‍රියාත්මක වීමය. ඉන් පසු කාලයේ ක්‍රමානුකූලව බ්‍රිතාන්‍යයේ ඡන්ද බලය ව්‍යාප්ත වීමට පටන් ගැනුනි. මෙසේ නියෝජනය හා ඡන්ද බලය ක්‍රියාත්මක වීමත් සමග පාලනයට ජනතා සහභාගීත්වය ඇති වීමෙන් ජනතාව හා ආණ්ඩුව අතර සම්බන්ධතාව ඇති කිරීමේ පුරුක වශයෙන් මෙන්ම ඡන්ද දායකයින් සංවිධිනය කිරීමේ විචල්‍ය වශයෙන් දේශපාලන පක්ෂ ආරම්භ වීම බ්‍රිතාන්‍ය දේශපාලන සමාජය තුළ සිදු විය.

බ්‍රිතාන්‍යයේ ප්‍රධාන පක්ෂ දෙක දේශපාලන පක්ෂ වශයෙන් සංවිධානාත්මකව ක්‍රියාත්මක වීමට පටන් ගැණුනේ 1830 ගණන්වල සිටය. මේ අනුව ඉඩම් හිමි රදල බලවේගයේ දේශපාලන පක්ෂය වශයෙන් කොන්සර්වේටිව් පක්ෂය ද වාණිජ මැද පංතිය තුළින් වර්ධනය වූ කාර්මික ධනපති බලවේගයේ දේශපාලන පක්ෂය වශයෙන් ලිබරල් පක්ෂය ද බිහි විය.

බ්‍රිතාන්‍යයේ දේශපාලන පක්ෂ බිහිවීමට සාපේක්ෂව ඇමරිකා එක්සත් ජනපදයේ ද දේශපාලන පක්ෂ බිහිවිය. එරටෙහිද දේශපාලන පක්ෂ බිහි වීම කෙරෙහි නියෝජනය හා ඡන්ද බලය පිළිබඳ සංකල්ප ඍජු ලෙස බලපා තිබේ. ඇත්ත වශයෙන්ම ඇමරිකානු නිදහස් අරගලයේ  මූලික අරමුණ වූයේ ද

# POLS 3107.03 - Political Parties, Pressure Groups and Public Opinion

නියෝජනය හා ඡන්ද බලය වැනි අයිතිවාසිකම් තහවුරු කර ගැනීමයි. ඇමරිකානු විප්ලවයේ සටන්පාඨය වූයේද ***නියෝජනයක් නැත්නම් බදු ගෙවීමක් ද නැත*** යන්නයි. ඇමරිකානු නිදහස් අරගලයෙන් පසු ක්‍රමාණුකූලව සමාජයේ විවිධ පංති බලවේගයන් විශේෂයෙන්ම මුල් අවධියේ දී ධනපති හා මැද පාංතික බලවේගයන් පාලනයට සහභාගිවීමට පටන් ගැනීමත් සමඟ ඡන්දදායකයින් සංවිධානය කිරීම සඳහාත් ජනතාව හා ආණ්ඩුව අතර සම්බන්ධතාව ඇතිකිරීම සඳහාත් දේශපාලන පක්ෂ ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව ඇති විය. මෙහි ප්‍රතිඵලය වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ සමූහාණ්ඩුවාදී පක්ෂය (Republican party) සහ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (Democatic party) බිහි විය. මෙම ප්‍රධාන පක්ෂ දෙක වඩාත් ස්ථාපිත වූයේ ඇමරිකා එක්සත් ජනපදයේ සිවිල් යුධ (1861 - 1864) සමයේය. එනම් එක්සත් ජනපදයේ සිවිල් යුද්ධයේ දී මධ්‍යම ආණ්ඩුවෙන් ඉවත් වීමට සටන් කළ දකුණු ප්‍රාන්තවල ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ව්‍යාප්ත වූ අතර මධ්‍යම ආණ්ඩුවේ බලය තහවුරු කර ගැනීම සඳහා සටන් වැදුනු උතුරු ප්‍රාන්තවල සමූහාණ්ඩුවාදී පක්ෂය ව්‍යාප්ත විය. මේ ආකාරයෙන් එක්සත් ජනපදයේ දේශපාලන පක්ෂ වර්ධනය වූ බව පෙනේ.

ලෝකයේ අනෙක් සෑම දේශපාලන ක්‍රමයකම දේශපාලන පක්ෂ වර්ධනය වීම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයත් සමග සිදු වූ බව පෙනේ. යටත්විජිත රාජ්‍යයන්හිද නිදහස ලැබීමේ ක්‍රියාදාමයට සාපේක්ෂව දේශපාලන පක්ෂ බිහිවීම දක්නට ලැබේ.